# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 24 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 24 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 30/67.

නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි. 107 අධි. v වෙළුම 56 පිටුව.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 24 දරන නොතාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන නොතාරිස් ආඥාපනතේ 4 වන වගන්තිය, එහි (1) වන උප වගන්තිය වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 107 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) අමාත්‍යවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයන් නොවන තැනැත්තන් නොතාරිස්වරුන් වශයෙන් පත් කළ හැකි ය :

එසේ වුව ද ඒ තැනැත්තන්—

(අ) යහපත් චරිතයක් සහ හොඳ නමක් ඇතිව සිටිය යුතු ය ;

(ආ) විසි අවුරුදු වයසට එළඹ සිටිය යුතු ය ;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකුගේ, මෙහි මින් මතු විධි විධාන සැලැස්වෙන පරිදි බලයලත් ප්‍රතිඥාත ආධුනිකයන්ව සිට අවුරුදු දෙකක් එසේ නිසි ලෙස සේවය කර තිබිය යුතු ය; තවද

(ඈ) අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරීක්ෂණයකින් සමර්ථ වී සිටිය යුතු අතර යථා පරිදි සුදුසුකම් ලබා සිටින බව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් වාර්තා කරනු ලැබ සිටිය යුතු ය:".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, එහි "අ" ශීර්ෂය යටතේ, මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(අ) එම උපලේඛනයේ 9 වන නියෝගය වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"9. සෑම ප්‍රතිඥාත ආධුනිකයකු ම අවුරුදු දෙකකට නො අඩු කාලයක් තම ගිවිසුම් ප්‍රතිඥා අනුව සේවය කළ යුතු ය."; තවද

(ආ) එම උපලේඛනයේ 10 වන නියෝගය වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"10. ප්‍රතිඥාත ආධුනිකයා සේවය කරන නීතිඥ ඒ ආධුනිකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් වෘත්තියෙහි යෙදෙන නොතාරිස් කෙනකු නොවේ නම්

2—කේ 22005—10,335 (73/5)

ඒ නීතිඥයා වෙත ආධුනිකයකු වශයෙන් අවුරුද්දක් ද තමා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් වෘත්තියෙහි යෙදෙන නොතාරිස් කෙනකුගේ කාර්යාල යෙහි ආධුනිකයකු වශයෙන් ඉන් පසු අවුරුද්දක් ද ඔහු සේවය කළ යුතු අතර, එසේ සේවය කිරීමට සිදු වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් අලුත් බලපත්‍රයක් ලබාගෙන ඒ බලපත්‍රයෙහි නම් සඳහන් නොතාරිස් සමග අලුත් ගිවිසුම් ප්‍රතිඥාවලට ඇතුළත් විය යුතු ය. ඒ ගිවිසුම් ප්‍රතිඥාවල පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය එහි අ2 ආකෘතිය සංශෝධනය කිරීමෙන් මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි අංක 5 දරන විෂය වෙනුවට මෙහි පහත දැක්වෙන විෂය ආදේශ කිරීමෙන් :—

"5. මම විසි අවුරුදු වයසට එළඹ සිටිමි."; තවද

(ආ) එහි අංක 9 දරන විෂයයෙහි (ඉ) ඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) මා විසි අවුරුදු වයසට එළඹ සිටින බව ඔප්පු කිරීමට මාගේ උප්පැන්න සහතිකය හෝ වයස පිළිබඳ වෙනත් තථ්‍ය සාක්ෂියක් (ඉ) අකුරින් ලකුණු කොට ඇත.".